**දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල - 2016**

---

දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

දේශීය ආදායම් දිරි දීමනා සම්බන්ධයෙන් සිදු වන ගනුදෙනුවල ගිණුම් කටයුතුභාවය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කෙරෙන නමුත් සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට දිරි දීමනා ගෙවීම සඳහා ලබා දී තිබුණු රු.529,000,000 ක මුදල සහ දිරි දීමනා හා සුභසාධන වියදම් සඳහා දරන ලද එකතුව රු.526,616,161 ක වියදම අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි. මෙම සියලු ම ලැබීම් හා ගෙවීම්වලට අදාළ ගනුදෙනු, අරමුදල සඳහා වූ පොදු තැන්පත් ගිණුමක් තුලින් සිදුකර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 210 (4) වගන්තිය | අරමුදල පරිපාලනය සඳහා කාර්ය පරිපාටියක් සකස් කර නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,017,117 ක අතිරික්තයක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,009,020 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,097 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉදිරිපත් කරන ලද ආදායම් හා වියදම් ගිණුම අනුව දිරි ගැන්වීමේ අරමුදලේ එකම ආදායම වූයේ රු.1,043,567 ක පොලී ලැබීම් වන අතර රු.26,450 ක ක්ෂය වීම් වියදම ලෙස වාර්තා වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 210 (1) වගන්තිය යටතේ දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල පිහිටුවා තිබුණු අතර පනතේ 210 (3) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයකට අනුව, නිලධාරීන්ගේ සුභසාධන කටයුතු හා දිරිගැන්වීමේ කටයුතු සඳහා අරමුදල් යෙදවීම අරමුදලේ කාර්යයන් ලෙස දක්වා තිබුණි. එහෙත් පනතේ විධි විධාන ප්‍රකාරව කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේ දී අරමුදලින් සිදු කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදලට භාණ්ඩාගාරය විසින් වරින් වර ලබා දී ඇති මුදල් රාජ්‍ය බැංකුවක තැන්පත් කර නිලධාරීන්ට නිවාස ණය ලබා දීමේ අරමුණින් නිවාස ණය අරමුදලක් පිහිටුවා තිබුණි. තැන්පත් මුදල් සහ එම මුදල ආයෝජනය කිරීම තුළින් වාර්ෂිකව උපයා ඇති පොලිය ඇතුළුව 2016 දෙසැම්බර් 31 දිනට නිවාස අරමුදලේ සමුච්චිත ශේෂය රු.33,074,123 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල නිවාස ණය අරමුදලින් නිලධාරීන් සඳහා කිසිදු ණය මුදලක් ලබා දී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිරි ගැන්වීමේ අරමුදල සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| | ---------------------------- | -------------------- |
| (අ) | ගිණුම්කරණය | අරමුදලේ ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම් ගත කිරීමේ ක්‍රම වේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ආ) | නිවාස ප්‍රතිලාභ අරමුදල ක්‍රියාත්මක කිරීම | රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන තැන්පතු භාවිතාකොට චක්‍රීය ණය අරමුදල ක්‍රියාත්මක කර නොතිබීම. |